# කාර්ය පත්‍රිකාව

**1.** පන්තිය : 8 ශ්‍රේණිය    විෂය : විද්‍යාව    අදාල සතිය : 04 සතිය ජනවාරි

**2.** ඒකකය : 02 **සත්ත්ව වර්ගීකරණය**

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:**

I. විද්‍යාව පෙළ පොතේ 02 පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

II. පරිසරයේ වෙසෙන ඔබ දන්නා කෘමි සතුන් නිරීක්ෂණය කරන්න.

III. මියගිය කෘමින්ගේ දේහ එකතු කරන්න.

IV. එම දේහ ඇතුළත් කර කෘමි පෙට්ටියක් සකසන්න.

V. ඔබ දන්නා කොඳු ඇට පෙළක් සහිත සතුන් හා කොඳු ඇට පෙළක් රහිත සතුන් ලැයිස්තු ගත කරන්න.

**4.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=25689
- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=25697

II. **e- තක්සලාව :**

- https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=123&lang=si
- https://www.ethaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=43788

**5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :**

i. අපෘෂ්ඨවංශී කාණ්ඩ සඳහා නිදසුන් කිහිපයක් සඳහන් කරමින් හැකි ආදර්ශ කිහිපයක් එකතු කරයි.

ii. පෘෂ්ඨවංශී කාණ්ඩ සඳහා නිදසුන් කිහිපයක් සඳහන් කරමින් හැකි ආදර්ශ කිහිපයක් එකතු කරයි.

**iii. බාහිර ලක්ෂණ උපයෝගී කර ගනිමින් දෙන ලද අපෘෂ්ඨවංශීන් ප්‍රධාන කාණ්ඩ වලට වර්ගීකරණය කරයි.**

**iv. බාහිර ලක්ෂණ උපයෝගී කර ගනිමින් දෙන ලද පෘෂ්ඨවංශීන් ප්‍රධාන කාණ්ඩ වලට වර්ගීකරණය කරයි.**

**v. අපෘෂ්ඨවංශීන්ගේ හා පෘෂ්ඨවංශීන්ගේ විවිධත්වය අගය කරයි.**

**6. ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

**i.** පහත ලක්ෂන හා ගැලපෙන සතුන් තෝරා යා කරන්න.

| **ලක්ෂණය** | **සතුන්** |
|---|---|
| ➢ දේහ සංතුලනය සඳහා වරල් දරයි. | මැඩියා |
| ➢ දේහය මතුපිට .බාහිර සැකිල්ලක් දරයි. | ගැඩවිලා |
| ➢ භෝජනය සඳහා හොටක් දරයි. | තිලාපියා |
| ➢ සිහින් දිග පණු ආකාර දේහ දරයි. | පොළඟා |
| ➢ බාහිර කවචයක් දරයි. | කැහිබෙල්ලා |
| ➢ ගාත්‍රා ක්ෂීණ වී ඇත. | මිනිසා |
| ➢ ග්‍රන්ථිමය තුනී සෙවලමය සමක් දරයි. | දෙපියන් බෙල්ලා |
| ➢ සමෙහි ස්වේද ග්‍රන්ථි දරයි. | ඉස්සා |

ii. පහත සඳහන් ජීවී කාණ්ඩ වල ජීවීන් ජීවත් වන පරිසර ලියන්න.

- නිඩාරියා - ...............................................
- ඇනලිඩා - ...............................................
- මොලුස්කා - ............................................
- ආත්‍රොපෝඩා - ........................................

iii. ඉහත ජීවී කාණ්ඩ වල ඇති විශේෂ ලක්ෂණ ලියන්න.

- නිඩාරියා - ...............................................
- ඇනලිඩා - ...............................................
- මොලුස්කා - ............................................
- ආත්‍රොපෝඩා - ........................................